# දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය-(පැරණි නිර්දේශය) -(2020 දෙසැම්බර්) සහ සම්මන්ත්‍රණ මාලාව - 2020 සැප්තැම්බර් /ඔක්තෝම්බර්**

## 1. විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සහ අයදුම්පත් ලබා ගැනීම

- 2019 හෝ ඊට පෙර වසරවල පැවැත් වු ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණයෙන් **සමත්** හා වලංගු ලියාපදිංචියක් සහිත බාහිර උපාධි අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට ඉහත පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය.

- විභාග අයදුම්පත්‍රය **2020-07-20** වන දින දක්වා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ **www.pdn.ac.lk/cdce** යන වෙබ් අඩවියෙන් බාගත (download) හැකිය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද **විභාග අයදුම්පත් 2020-08-20 වන දින හෝ ඊට පෙර "සහකාර ලේඛකාධිකාරී" දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, අංක 43, පරණ ගලහ පාර,පේරාදෙණිය ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතිකෙෂ්ප කරනු ලැබේ.**

## 2. සම්මන්ත්‍රණ මාලාව සඳහා උපදෙස්

2020 දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත පරීක්ෂණය ඉලක්ක කරගනිමින් සැලසුම් කරන ලද සම්මන්ත්‍රණ මාලාව **2020 සැප්තැම්බර් මස සිට ඔක්තෝම්බර් මස දක්වා සති අන්තයන්හිදී** පැවැත්වීමට නියමිතය.

ඉහත පරීක්ෂණයට අදාළ සම්මන්ත්‍රණ අයදුම්පත් **2020-08-15** වන දින දක්වා අපගේ නිල වෙබ් අඩවිය හරහා පමණක් නිකුත් කරනු ලැබේ.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද **සම්මන්ත්‍රණ අයදුම්පත් 2020-08-30 වන දින හෝ ඊට පෙර "සහකාර ලේඛකාධිකාරී" දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, අංක 43, පරණ ගලහ පාර,පේරාදෙණිය ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවිය යුතුය.(සම්මන්ත්‍රණ අයදුම්පත වෙනම ලිපිකවරයක බහා එවිය යුතුය).**

**සැ.යු.**

- සම්මන්ත්‍රණය පැවැත්වීම හෝ නොපැවැත්වීම ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අනුව තීරණය වන බව සලකන්න.

**විශේෂ නිවේදනයයි**

**විභාග අයදුම්පත්, උපදෙස් පත්‍රිකා, සම්මන්ත්‍රණ අයදුම්පත්, විභාග ප්‍රවේශ පත්‍රය,විභාග කාල සටහන, ආසන සැලැස්ම හා සම්මන්ත්‍රණ ප්‍රවේශ පත්‍ර, සම්මන්ත්‍රණ කාල සටහන,** ආදී සියලුම ලිපි ලේඛන අපගේ වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමට අවස්ථාව ලබාදී ඇත. එබැවින් අප ආයතනයෙන් කිසිදු දැනුම් දීමක් හෝ ලිපි ලේඛනයක් මින් ඉදිරියට තැපැල් මගින් ඔබ වෙත යොමු නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**සැ.යු.**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය යටතේ පවත්වාගෙන යනු ලබන ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව (පැරණි නිර්දේශය) සඳහා අදාළ පරීක්ෂණ පැවැත්වීම **2022 වර්ෂයෙන් අවසන් වීමට නියමිතය. 2022 වර්ෂයෙන් පසු මොනයම් හේතුවක් මත හෝ මෙම විභාගය නොපැවැත්වෙන බව කාරුණිකව සලකන්න.**

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා **081-239 2218 /081 - 2392210** කායඵාලයීය වේලාව තුළ අමතන්න.

වැඩ බලන ලේඛකාධිකාරී
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2020.07.02

